# සංකල්ප පත්‍රිකාව - අකුර (සිංහල/ දෙමළ)

## තාර්කිතය (Rational)

2020 හා 2021 වසර වල Covid 19 ආපදා තත්ත්වය මත අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි බරපතලම අවදානමට ලක් වූ ශිෂ්‍ය කණ්ඩායම 2020, 1 ශ්‍රේණිය හා 2020, 2 ශ්‍රේණිය සහ 2021, 1 ශ්‍රේණිය, 2021, 2 ශ්‍රේණිය හා 2021, 3 ශ්‍රේණිය වේ.

මෙම දරුවන් 1 ශ්‍රේණියේදී සිංහල අකුරු 36ක් *(දෙමළ මාධ්‍යය නම් අකුරු 30ක්),* 2 ශ්‍රේණියේදී සිංහල අකුරු 24 ක් *(දෙමළ අකුරු නම් 40ක්)* ඉගෙනගතයුතුය.

එය වෙන කිසිවෙකුට කල නොහැකි අතර ගුරුතුමා / ගුරුතුමිය විසින් පෞද්ගලිකව මැදිහත් වී හුරුව ලබා දිය යුතුය.

ඊට අදාළව එක් එක් අකුරක් ඉගැන්වීමේ ක්‍රමවේද පවතින අතර පියවර 7කින් යුතු එම ක්‍රමවේද ගැන අවබෝධය හා ඉගැන්විය හැකි නිපුණතාව ඇත්තේ ගුරුතුමා/තුමියට පමණි.

Covid 19 සමය තුළ පාසල වසා තැබීම නිසා 1 හා 2 වසර දරුවන්ට අහිමි වූ මෙම අවස්ථාව දිගුකාලීනව බරපතල අධ්‍යාපන බිඳවැටීමකට හේතු වේ.

මූලිකවම ගත්විට එම දරුවන්ට 3 වසරේ සිට අකුරු, වචන, වාක්‍ය ලිවීමේ හා තේරුම් ගැනීමේ ගැටළු මතුවේ. එම ඌනතාව ආවරණය කිරීම සඳහා 3 ශ්‍රේණියේදී විකල්ප අවස්ථා නොමැතිවීම ඊට කාලය හා හැකියාව 3 ශ්‍රේණිය ගුරුතුමා/තුමිය නොමැතිවීම බරපතල ගැටළුවකි. මෙම දරුවන් 2085 දක්වාම රටේ ශ්‍රම බලකාය වේ. මෙම හැකියාව වර්ධනයට වහාම උපකාර නොකිරීම Covid 19 ආපදාව මත අධ්‍යාපන බිඳවැටීම, 2085 දක්වාම රටේ සංවර්ධනයට බලපාන සාධකයක් වනු ඇත.

එබැවින් නිවසේ සිට දරුවාට “අකුර” අධ්‍යයනය කොට හඳුනාගැනීම, ලිවීම හා භාවිතය සඳහා නිපුණතාව ලබාදීම පිණිස, ශ්‍රව්‍ය, දෘෂ්‍ය සහසක්‍රිය (Audio, Video, Interactive) දුරස්ථ අධ්‍යාපන උපාය මාර්ගයක් ලෙස “අකුර Video පාඩම්” සැකසීම අත්‍යවශ්‍ය ජාතික මෙහෙවරක් ලෙස සලකා කටයුතු කරනු ලැබේ.

# අරමුණු

I. Covid 19 ආපදාව හමුවේ 1 හා 2 ශ්‍රේණි දරුවන්ට අහිමි වූ අකුරු කරන නිපුණතාව ක්‍රමිකව ලබාදීමට විකල්ප උපාය මාර්ගයක් නිර්මාණය.

II. පාසල් වසා තැබීම නිසා දරුවාට අහිමි වන ගුරු මඟපෙන්වීම ශ්‍රව්‍ය, දෘෂ්‍ය මාධ්‍ය මඟින් ලබාදෙමින් වැඩිහිටි මඟපෙන්වීම මත අකුරු හුරුව දරුවන්ට ලබාදීම.

III. දරුවන්ට වඩාත් ආකර්ෂණීය වර්ණ, චලන, රූප, රිද්ම, රටා සහිතව ශ්‍රව්‍ය, දෘෂ්‍ය සහසක්‍රීය උපාය මාර්ග මත පාඩම් නිර්මාණය.

IV. එම පාඩම් e-nenapiyasa (LMS) මඟින් ලබාදීම හා දුරස්ථ ක්‍රමයට (Online) හෝ මුද්‍රිත ක්‍රමයට භාවිතය දිරිගැන්වීම.

V. එම පාඩම් Covid 19 Recovery වැඩසටහනක් ලෙස මෙන්ම ඉදිරියේදී පන්ති කාමර ශ්‍රව්‍ය, දෘෂ්‍ය ආධාරකයක් ලෙස ගුරුවරයාට භාවිතා කිරීමට උනන්දු කරවීම සහ දුරස්ථ අධ්‍යාපන උපකරණයක් ලෙස භාවිතය.

VI. ඕනම දරුවෙකුට අකුරු නිසි ලෙස හඳුනාගැනීම හා ලිවීමට හුරුවීම සඳහා අතිරේක ස්වයං අධ්‍යාපන කට්ටලයක් ලෙස භාවිතා කල හැකි වීම.

VII. විවිධ මාධ්‍ය උපාය මාර්ග එක් කර එම පාඩම් ස්වයං අධ්‍යාපන පත්‍රිකා ලෙස සංවර්ධනය

# ක්‍රමවේදය

I. සංකල්පය පිළිබඳව විෂය අධ්‍යක්ෂවරු සමඟ සාකච්ඡා කිරීම හා "එම සංකල්පය" ක්‍රියාත්මක කිරීමට උචිත ලෙස සැකසීම.
II. සුදුසු ගුරුවරු හා ගුරු උපදේශකවරු තෝරා ගැනීම.
III. "අකුර" ශ්‍රව්‍ය, දෘෂ්‍ය සහසක්‍රිය (Interactive) මාධ්‍යයට සැකසීම සඳහා පිටපත් රචනය (Script writing)
IV. තෝරා ගත් ගුරුවරු පුහුණු කිරීම
V. පන්ති කාමර ඉගැන්වීම, වීඩියෝගත කිරීම.
VI. පාඩම් සඳහා ශ්‍රව්‍ය, දෘෂ්‍ය (Animation) උපායමාර්ග සැකසීම.
VII. ශ්‍රව්‍ය, දෘෂ්‍ය උපාය මාර්ග සමඟ වීඩියෝව සංස්කරණය.
VIII. වීඩියෝව. උපාය මාර්ග, ශ්‍රව්‍ය, දෘෂ්‍ය සංකලන හා එක් එක් අකුරට අදාළ වාග් ව්‍යවහාර විශේෂඥ මණ්ඩලයක් මඟින් පරීක්ෂා කර තහවුරු කිරීම.
IX. ශ්‍රව්‍ය, දෘෂ්‍ය වීඩියෝව සැකසීම හා ප්‍රචාරය, බෙදාහැරීම හා භාවිතයට දිරිගැන්වීම.
X. නව සංස්කරණයන් සඳහා කටයුතු කිරීම

# කාලරාමුව *(2021* **Covid 19** ආවරණය)

I. සංකල්ප පිළිබඳව විෂය අධ්‍යක්ෂවරු සමඟ සාකච්ඡා කිරීම හා සංකල්ප ක්‍රියාත්මක කිරීමට උචිත ලෙස සැකසීම *(2020)*

II. සුදුසු ගුරුවරු හා ගුරු උපදේශකවරු තෝරා ගැනීම *(2021).*

III. අකුර ශ්‍රව්‍ය, දෘෂ්‍ය සහසක්‍රිය (Interactive) මාධ්‍යයට සැකසීම සඳහා පිටපත් රචනය (Script writing) *(2021)*

IV. තෝරා ගත් ගුරුවරු පුහුණු කිරීම *(2021)*

V. පන්ති කාමර ඉගැන්වීම, වීඩියෝගත කිරීම *(2021)*

VI. පාඩම් සඳහා ශ්‍රව්‍ය, දෘෂ්‍ය (Animation) උපායමාර්ග සැකසීම *(2021).*

VII. ශ්‍රව්‍ය, දෘෂ්‍ය උපාය මාර්ග සමඟ වීඩියෝව සංස්කරණය *(2021).*

VIII. වීඩියෝව. උපාය මාර්ග, ශ්‍රව්‍ය, දෘෂ්‍ය සංකලන හා එක් එක් අකුරට අදාළ වාග් ව්‍යවහාර විශේෂඥ මන්ඩලයක් මඟින් පරීක්ෂා කර තහවුරු කිරීම *(2021).*

IX. ශ්‍රව්‍ය, දෘෂ්‍ය වීඩියෝව සැකසීම හා ප්‍රචාරය, බෙදාහැරීම හා භාවිතයට දිරිගැන්වීම *(2021)*

X. නව සංස්කරණයන් සඳහා කටයුතු කිරීම *(2021/2022).*

# ලබා ඇති ප්‍රගතිය

I. “අකුර” සිංහල/ දෙමළ මාධ්‍ය අන්තර්ජාලවට මුදා හැර ඇත. දරුවන්, ගුරුවරුන්, වැඩිහිටියන් විසින් රට තුලම භාවිතා කරමින් පවතී.
II. මෙමඟින් දරුවා සහ ගුරුවරයා 3 ශ්‍රේණියේ සිට මුහුණ දෙන අභියෝග වන අකුරු නුහුරුවීම මඟහරවා ලීමට උපරිම හා නිවැරදි මඟපෙන්වීම් ලබා දී ඇත.
III. ජාතික මට්ටමේ දී ද ඇගයීමට ලක්ව ඇත.
IV. Covid 19 අධ්‍යාපන ආපදා ආවරණය පිණිස මෙම ඉලක්කයට අදාලව ලංකාවේ පවතින එකම උපාය මාර්ගය මෙය වේ.